www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 - ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - I

නම/විභාග අංකය :- ................................ ..........................                    කාලය: පැය 01 යි.

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති. ආදී වශයෙන් පවසමින් සිදුහත් කුමරාට නිබ්බුත පද කීවේ,

(1) යශෝදරා කුමරිය    (2) කිසාගෝතමී කුමරිය
(3) සුජාතා සිටුදේවිය    (4) ප්‍රජාපතී දේවිය

(02) බෝසත් සිරිත සැබෑ ලෙසම අභියෝග රැසකින් පිරී පැවතුණි. කුමරු ඒ සියල්ල ජයගනු ලැබුවේ,

(1) සතර පෙර නිමිති දැකීමෙනි.
(2) නිබ්බුත පද ඇසීමෙනි.
(3) ඉවසීමෙන් කටයුතු කිරීමෙනි.
(4) ඉවසීම කැපවීම හා අධිෂ්ඨානය මුල්කොට ගෙන කටයුතු කිරීමෙනි.

(03) ගැබිනි මාතාවන්ට ආශිර්වාද කරවා ගැනීමට දේශනා කරවා ගත්තේ,

(1) කරණීය මෙත්ත සූත්‍රය    (2) අංගුලිමාල පිරිත
(3) ජය පිරිත    (4) මෝර පිරිත

(04) ගිහියා මිථ්‍යාවෙන් මුදවා සත්‍යය කරා යොමු කිරීමේ සමාජමය නායකත්වය පැවරී ඇත්තේ,

(1) සංඝ රත්නයට ය.    (2) දෙමාපියන්ට ය.    (3) ගුරුවරුන්ට ය.    (4) වැඩිහිටියන්ට ය.

(05) නිවන් පසක් කිරීමට අවශ්‍ය වන මනා වූ පිළිවෙත් පුරන බැවින් සංඝ රත්නය

(1) සුපටිපන්න නම් වේ.    (2) උජුපටිපන්න නම් වේ.
(3) ආහුනෙය්‍ය නම් වේ.    (4) දක්ඛිණෙය්‍ය නම් වේ.

(06) බුදු දහමේ පංච නීවරණ උපමා මගින් දක්වා ඇත. එහි බොර ජලයට උපමා කර ඇත්තේ,

(1) විචිකිච්ඡාවයි.    (2) උද්දච්ච කුක්කුච්චයි.
(3) ථීනමිද්ධයි    (4) ව්‍යාපාදයයි.

(07) බුදුරජාණන් වහන්සේ ආර්ය මාර්ගයේ ගමන් කළ නිසාත්, සුන්දර වූ නිර්වාණයට සැපත් වූ නිසාත් යහපත් ගමන ඇති නිසාත්,

(1) අරහං නම් වේ.    (2) සම්මා සම්බුද්ධ නම් වේ.
(3) සුගත නම් වේ.    (4) ලෝකවිදූ නම් වේ.

(08) සියලු කෙලෙස් මුළුමනින් ම නැති කොට ලබන නොබිඳෙන චිත්ත පාරිශුද්ධිය තුළින්ම ඇති තතු ඇති සැටියෙන්ම දැකීම හඳුන්වන්නේ,

(1) භාවනාව නමිනි.    (2) ප්‍රඥාව නමිනි    (3) නිවන නමිනි    (4) ශ්‍රද්ධාව නමිනි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(09) (අ) බුදුගුණඅලංකාරය (ආ) මුණිගුණාලංකාරය
(ඇ) සාරාර්ථ සංග්‍රහය (ඉ) සතර බණවර සන්නය යනාදී කෘති අතර වැලිවිට සරණංකර හිමි රචනා කළ කෘති වන්නේ,

(1) අ, ආ, ඇ (2) අ, ආ, ඉ (3) අ, ඇ, ඉ (4) ආ, ඇ, ඉ

(10) සිගාලෝවාද සූත්‍රයට අනුව නැගෙනහිර හා දකුණු දිශාවන්ගෙන් හඳුන්වා ඇත්තේ කුමන සමාජ කණ්ඩායම් ද?

(1) ගුරුවරු , පැවිදි පක්ෂය (2) ගුරුවරු , මිතුරන්
(3) දෙමාපියන්, ගුරුවරුන් (4) දෙමාපියන්, පැවිදි පක්ෂය

(11) පැවිදි පක්ෂය විසින් ගිහියාට ඉටුකළ යුතු යුතුකම් ගණන,

(1) තුනකි (2) පහකි (3) හතරකි (4) හයකි

(12) ඔබ දෙවියෙක්ද, ගාන්ධර්වයෙක් ද, මනුෂ්‍යයෙක් ද යනුවෙන් බුදුරජාණන් වහන්සේගෙන් විමසා සිටියේ,

(1) උපක ආජීවකතුමා (2) බිම්බිසාර රජතුමා
(3) ද්‍රෝණ බමුණා (4) අග්ගික භාරද්වාජ බමුණා

(13) "කිසිවෙක් බොරුවෙන් මාව රවටනවාට මා අකමැති බැවින් මම ද කිසිවිටක බොරුවක් නොකියමි'යි චරිතා පැවසුවා ය. ඇය අනුගමනය කරන්නේ,

(1) ත්‍රිකෝටි පාරිශුද්ධි ශීලයයි. (2) අත්තූපනායික ධර්ම පර්යායයි.
(3) අධිපති ධර්මයි. (4) සිවු සඟරාවතයි.

(14) දස අකුසල් අතර මනෝ කම්ම ගණයට ඇතුළත් වන්නේ,

(1) ප්‍රාණඝාතයයි. (2) කාමමිථ්‍යාචාරයයි. (3) සම්ඵප්පලාපයයි (4) ව්‍යාපාදයයි

(15) කෙනෙකු මිය පරලොව ගොස් ඊළඟ භවයක උපත ලබා දීමට ඉවහල් වන කර්මය වන්නේ,

(1) ජනක කර්මය (2) ආසන්න කර්මය (3) ආචිණ්ණ කර්මය (4) උපත්ථම්භක කර්මය

(16) රූපිකා දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගතකිරීමට හැකි විය. එසේ වූයේ,

(1) කාල සම්පත්ති හේතුවෙනි. (2) උපධි සම්පත්ති හේතුවෙනි.
(3) ප්‍රයෝග සම්පත්ති හේතුවෙනි. (4) ගති සම්පත්ති හේතුවෙනි.

(17) බුදු දහමට අනුව පංචස්කන්ධය උපමා මගින් දක්වා ඇත. එහි වේදනාව උපමා කර ඇත්තේ,

(1) පෙණ පිඩකට (2) දිය බුබුළකට (3) මිරිඟුවකට (4) මායාවකට

(18) යේ ධම්මා හේතුප්පභවා.... යන ගාථාව දේශනා කරමින් මහා ශ්‍රමණ වූ තථාගතයන් වහන්සේ මෙබඳු දේශනාවක් කරන්නෙකි යනුවෙන් පැවසුවේ,

(1) උපක ආජීවකතුමා උපතිස්ස පරිබ්‍රාජකතුමාට (2) උපක ආජීවකතුමා කෝලිත පරිබ්‍රාජකතුමාට
(3) අස්සජි තෙරණුවෝ උපතිස්ස පරිබ්‍රාජකතුමාට (4) අස්සජි තෙරණුවෝ උපක ආජීවකතුමාට

(19) බුදුන් වහන්සේගේ මංගල ධර්ම දේශනාව වන්නේ,

(1) දම්සක් පැවතුම් සූත්‍රයයි. (2) අනත්ත ලක්ඛණ සූත්‍රයයි
(3) මහා මංගල සූත්‍රයයි. (4) කරණීයමෙත්ත සූත්‍රයයි.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

(20) පරලොවක් නැත යන පිළිගැනීම මත මෙලොව වශයෙන් හැකිතාක් සැප විඳීමට ඇති ආශාව
(1) කාම තණ්හාවයි. (2) භව තණ්හාවයි. (3) විභව තණ්හාවයි (4) රූප තණ්හාවයි

(21) පරපණ නැසීම, සොරකම, වැරදි කාම සේවනය යන අකුසල් තුනෙන් වැළකීම හැඳින්වෙන්නේ,
(1) සම්මා දිට්ඨි නමිනි. (2) සම්මා සංකප්ප නමිනි.
(3) සම්මා කම්මන්ත නමිනි. (4) සම්මා ආජීව නමිනි.

(22) බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේට උතුම් බුදුබව ලබාදීමට උපකාරි වූ ඇසතු බෝධි වෘක්ෂයට කෘතවේදීත්වය දැක්වීම සඳහා ඇසිපිය නොහෙළා බලා සිටියේ,
(1) පළමුවන සතියේ ය. (2) දෙවන සතියේ ය.
(3) පස්වන සතියේ ය. (4) හතරවන සතියේ ය.

(23) බුදුරජාණන් වහන්සේ පළමු වන වස්කාලය ගත කළේ,
(1) බරණැස ඉසිපතන මිගදායේ ය. (2) වේළුවනාරාමයේ ය.
(3) මකුල පර්වතයෙහි ය (4) පාරිලෙය්‍ය වනයෙහි ය.

(24) ලෙහෙනුනගේ අභය භූමියක් වූ කලන්දක නිවාප නම් ස්ථානයේ දී බුදුරජාණන වහන්සේ දේශනා කළේ,
(1) අම්බට්ඨ සූත්‍රයයි. (2) සිංසපා සූත්‍රයයි.
(3) මහා මොග්ගල්ලාන සූත්‍රයයි. (4) තේවිජ්ජ සූත්‍රයයි.

(25) පමණ දැන ආහාර ගන්නා ලෙස බුදුරජාණන් වහන්සේ වදාළේ,
(1) කොසොල් රජුට ය. (2) ගිරිමානන්ද හිමියන්ට ය.
(3) ද්‍රෝණ බමුණාට ය. (4) අනේපිඬු සිටුතුමාට ය.

(26) අවිධිමත් ලෙස, එමෙන්ම ගිජු ලෙස ආහාර අනුභව කරන්නන් සදෙනකු ගැන බෞද්ධ සාහිත්‍යයේ සඳහන් වේ. එහිදී ආහාර ගත් පසු ඇඳුම ඇඳ ගැනීමටත් බැරි තරමට ඇඳුම ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා හඳුන්වන්නේ,
(1) ආහාර හත්ථක නමිනි (2) අලංසාටක නමිනි
(3) තත්ථා වට්ටක නමිනි (4) භුත්තවමිතක නමිනි

(27) බුදුරජාණන් වහන්සේ විනයෙහි අනුදැන වදාරා ඇති සිරිත් විරිත් සමූහයකි. ඒවා හැඳින්වෙන්නේ,
(1) සමාදාන නමිනි. (2) විරමණ නමිනි. (3) සිරිත් නමිනි (4) සේඛියා නමිනි

(28) ථේරවාදී පස්වන හා හයවන ධර්ම සංගායනා පවත්වා ඇත්තේ,
(1) ඉන්දියාවේ දී ය. (2) ලංකාවේ දී ය.
(3) මියන්මාරයේ දී ය. (4) තායිලන්තයේ දී ය.

(29) ථේරවාදී සිව්වන ධර්මසංගායනාව පැවැත්වූයේ,
(1) මාතලේ අලුවිහාරයේ ය. (2) කාශ්මීරයේ කුණ්ඩල විහාරයේ ය.
(3) පැළලුප් නුවර අශෝකාරාමයේ ය. (4) විශාලා මහනුවර වාලුකාරාමයේ ය.

(30) අභයගිරිය කරවා කුපික්කල මහා තිස්ස හිමියන්ට පූජා කළේ,
(1) ප්‍රාදේශීය නායකයෙකි. (2) වලගම්බා රජතුමා ය.
(3) කනිෂ්ක රජතුමා ය. (4) දෙවන පෑතිස් රජතුමා ය.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

(31) බුදු දහම ස්ථාපිත වීමත් සමඟ ඉදිවූ මුල්ම ස්තූපය වන ථූපාරාමයේ නිදන් කර ඇත්තේ බුදුන් වහන්සේගේ,

(1) දකුණු අකු ධාතූන් වහන්සේ ය. (2) වම් දළදා වහන්සේ ය.

(3) දකුණු දළදා වහන්සේ ය. (4) ලලාට ධාතූන් වහන්සේ ය.

(32) ධාන්‍යාකාර ස්තූපයක් දැකිය හැකි ආගමික ස්ථානයක් වන්නේ,

(1) මහියංගණයයි. (2) කතරගම කිරිවෙහෙරයි.

(3) කැළණි රජමහා විහාරයයි. (4) පොළොන්නරුව සත්මහල් ප්‍රාසාදයයි.

(33) ස්තූපයක් සඳහා ඉදිවූ වෘත්තාකාර පියස්සක් [illegible] හැඳින්වෙන්නේ,

(1) වටදාගෙය නමිනි. (2) බෝධිඝරය නමිනි.

(3) පටිමාඝරය නමිනි. (4) වාහල්කඩ නමිනි.

(34) මෙතෙක් හමු වී ඇති කලාත්මක බවින් උසස් ම බෝධිඝරය පිහිටා ඇත්තේ,

(1) අනුරාධපුර බිසෝමාලිගය අසල ය. (2) රත්න ප්‍රාසාදය නමැති ගොඩනැගිල්ල අසල ය.

(3) කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිල්ලක්ගමය. (4) මිහින්තලේ කණ්ටක චෛත්‍යය අසල ය.

(35) පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දක්නට ලැබෙන්නේ,

(1) තිවංක පිළිමගෙය තුළ ය. (2) හිඳගල නම් ස්ථානයේ ය.

(3) සීගිරියේ ය. (4) බොරැල්ල ගෝතමී විහාරයේ ය.

(36) බුදුරජාණන් වහන්සේගේ අරහං බුදුගුණය තේමා කරගෙන පූජාවලිය රචනා කරනු ලැබුවේ,

(1) ගුරුළුගෝමී පඬිතුමා ය. (2) වැත්තෑවේ හිමි ය.

(3) රණස්ගල්ලේ හිමි ය. (4) මයුරපාද පිරිවෙන්පති බුද්ධ පුත්‍ර හිමි ය.

(37) කව්සිළුමිණ ග්‍රන්ථය රචනා කිරීමට තේමා වූයේ කුමන ජාතක කතාවක් ද?

(1) සත්තුභත්ත ජාතකය (2) සස ජාතකය

(3) කුස ජාතකය (4) මඛාදේව ජාතකය

(38) මාස ගණනක්, බුදුරජාණන් වහන්සේ සමඟ සිටිමින් උන්වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළේ,

(1) බ්‍රහ්මායු නම් තරුණ බමුණා ය. (2) වක්කලි හිමියන් ය.

(3) ද්‍රෝණ බමුණා ය. (4) අභයරාජ කුමාරයා ය.

(39) දස සක්විතිවත් නම් වූ පාලන පිළිවෙත් දහය දැක්වෙන්නේ,

(1) පත්තකම්ම සූත්‍රයේ ය. (2) දීඝ නිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.

(3) මහා සීහනාද සූත්‍රයේ ය. (4) සිගාලෝවාද සූත්‍රයේ ය.

(40) පුබුදු උදෑසන පාසල් යද්දී බඩගින්නේ සිටි බලු පැටවකු දැක සිත තුළ අනුකම්පාව ඇති වී ඔහුගේ ආහාර පාර්සලය බලු පැටවාට දුන්නේ ය. ඔහු තුළ ඇති ගුණාංගය,

(1) මෛත්‍රී ය. (2) කරුණාව ය.

(3) මුදිතාව ය. (4) උපේක්ෂාව ය.





Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 10 ශ්‍රේණිය

## බුද්ධ ධර්මය - II

නම/විභාග අංකය :- ........................................................ කාලය: පැය 02 යි.

**පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(01) (i) බුදුරජාණන් වහන්සේ විසින් සිරුරෙහි විවිධ ආබාධ හටගන්නා බවද එම රෝග වැළඳීමට හේතූන් ද දේශනා කළේ කාහට ද?

(ii) "භාවෙති කුසල ධම්මේ ආසේවති වඩ්ඪේති ඒතායතානි භාවනා" යන්නෙහි අදහස ලියන්න.

(iii) නිර්වාණ අවබෝධ කරගැනීමට බෞද්ධයකු අත්හළ යුතු අන්ත දෙක නම් කරන්න.

(iv) සතර අගති නම් කරන්න.

(v) යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතුං තථාගතෝ ආහ
තේසංච යෝ නිරෝධෝ - ඒවං වාදී මහාසමණෝ" යන ගාථාවෙන් ඉගැන්වෙන දහම් කරුණ කුමක් ද?

(vi) බුදුරජාණන් වහන්සේ ඇතකුගේ හා වඳුරකුගේ උපස්ථාන ලබමින් දහවන වස්කාලය ගත කළ ස්ථානය නම් කරන්න.

(vii) එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම ආරම්භ කළේ කවු ද?

(viii) සීහලට්ඨ කතා හෙවත් හෙළ අටුවා යනු මොනවා ද?

(ix) බුදු දහමේ සඳහන් අත්තුපනායික ධර්ම පර්යාය යනු කුමක් ද?

(x) යහපත් වචනයක ලක්ෂණ හතරකි. ඒවා ලියා දක්වන්න.

(ලකුණු 02 x 10 = 20)

(02) (i) බෞද්ධ භාවනා වර්ග දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) සමථ භාවනාව වැඩීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) දෛනික ජීවිතය සාර්ථක කර ගැනීමට සමථ භාවනාව ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) උතුම් සීලාදී පිළිවෙත්වල නොයෙදීම.... ආදිය හේතුවෙන් ජලය සිඳී ගිය පොකුණු දෙස බලා පසුතැවෙන මහලු කොස්වාලිහිණියන් මෙන් පසුතැවීමට සිදුවන බව දක්වෙන ධම්මපද ගාථාව ලියන්න. (ලකුණු 02)

(ii) එහි තේරුම ලියන්න. (ලකුණු 03)

(iii) සාර්ථක ජීවිතයක් සඳහා ධම්මපදය උපයෝගී කරගත හැකි අයුරු විස්තර කරන්න. (ලකුණු 05)



Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

agaram.lk

www.agaram.lk

(04) (i) කර්මය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) විපාක දෙන කාල වශයෙන් කර්මයේ ප්‍රභේද හතරකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 03)

(iii) "වර්තමාන කර්මවලින් හා පරිසර සාධකවලින් අතීත කර්ම ශක්තීන් වෙනස් කරගත හැකි ය." ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 05)

(05) (i) ශ්‍රද්ධාව යනු කුමක් ද? (ලකුණු 02)

(ii) ශ්‍රද්ධාවන්තයකු තුළ දැකිය හැකි ලක්ෂණවලින් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රද්ධාවන්තව කටයුතු කිරීමෙන් මෙලොව පරලොව ජීවිත සාර්ථක කරගත හැකි අයුරු විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) දැහැමි රාජ්‍ය පාලනයට යොදාගත හැකි බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම (ප්‍රතිපත්ති) දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) බුද්ධ කාලීන වජ්ජි පාලකයන් ආරක්ෂා කළ සප්ත අපරිහානිය ධර්ම වලින් තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) බෞද්ධ රාජ්‍ය පාලන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම නිසා රටට හා ජනතාවට සිදුවන යහපත විස්තර කරන්න. (ලකුණු 05)

(07) පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) දුටුගැමුණු රජතුමා

(ii) සඳකඩ පහණ

(iii) සිගාලෝවාද සූත්‍රයේ සඳහන් ගුරු සිසු යුතුකම්

(iv) සතර සංග්‍රහ වස්තුව (ලකුණු 05 x 2 = 10)



Agaram.LK - Keep your dreams alive!
agaram.lk